18022



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | | |
|---|---|---|
| ඉතිහාසය | I | (II කොටස) |
| வரலாறு | I | (பகுதி II) |
| History | I | (Part II) |

25 S I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

   (i) ජම්බුකෝලපට්ටන (ii) යාන් ඔය (iii) සේරුවිල (iv) යෝධ වැව
   (v) යාපහුව (vi) දෙවිනුවර (vii) මීගමුව (viii) මධ්‍යම පළාත

   (නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි)

2. දොළොස්වන සියවස අවසානය දක්වා ශ්‍රී ලාංකේය ඉතිහාසය හැදෑරීමෙහිලා පහත සඳහන් මූලාශ්‍රවල ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.

   (i) අභිලේඛන
   (ii) පුරාවස්තු හා නටබුන්
   (iii) නාණක (ලකුණු 14යි)

3. පහත දැක්වෙන ශීර්ෂ යටතේ අනුරාධපුර යුගයේ පැවති ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

   (i) කෘෂිකර්මාන්තය හා වාරිමාර්ග
   (ii) වෙළෙඳාම (ලකුණු 14යි)

4. "පළමුවන විජයබාහු හා පළමුවන පරාක්‍රමබාහු පොළොන්නරු යුගයේ සිටි ශ්‍රේෂ්ඨ නරපතියෝ වෙති."

   (i) පළමුවන විජයබාහු රජතුමා සිහසුනට පත්වීමට පෙර හඳුන්වන ලද්දේ කුමන නමකින් ද? (ලකුණු 01යි)
   (ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ පියා සහ මව නම් කරන්න. (ලකුණු 02යි)
   (iii) මෙම රජවරුන් දෙදෙනා විසින් බුදු දහමට ඉටු කරන ලද සේවය සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි)
   (iv) පළමුවන විජයබාහු හා පළමුවන පරාක්‍රමබාහු යන රජවරුන්ගේ දේශපාලන කාර්යසාඵල්‍යය තුලනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 07යි)

5. "හයවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රී ලංකාව එක්සේසත් කළ අවසාන පාලකයා ලෙස සලකනු ලැබේ."

   (i) හයවන පරාක්‍රමබාහු රජතුමාගේ පාලන මධ්‍යස්ථානය කුමක් ද? (ලකුණු 01යි)
   (ii) හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වැඩවාසය කළ ප්‍රධාන භික්ෂූන් වහන්සේ **දෙනමක්** නම් කරන්න. (ලකුණු 02යි)
   (iii) හයවන පරාක්‍රමබාහු රජුගේ සමයේ පැවති අධ්‍යාපන තත්ත්වය සැකෙවින් දක්වන්න. (ලකුණු 03යි)
   (iv) හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් දිවයින එක්සේසත් කරනු ලැබීමේ ප්‍රධාන අවස්ථා විස්තර කරන්න. (ලකුණු 08යි)

6. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ දේශපාලන හා සංස්කෘතික කාර්යසංසිද්ධිය ප්‍රමාණ කරන්න. (ලකුණු 14යි)

7. දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ සංස්කෘතික පුනර්ජීවනය හා සම්බන්ධ පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **එකක** වැදගත්කම සාකච්ඡා කරන්න.

   (i) බෞද්ධ පුනර්ජීවනය (ලකුණු 14යි)
   (ii) හින්දු හා ඉස්ලාමීය පුනර්ජීවනය (ලකුණු 14යි)

[ අටවැනි පිටුව බලන්න.

8. **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14යි)

**(B)** 1972 ජනරජ ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) අනුරාධපුර යුගයේ දකුණු ඉන්දීය ආක්‍රමණ

(ii) ගම්පොළ රාජධානිය

(iii) යාපනය රාජධානිය හා පෘතුගීසින්

(iv) මුහුදුබඩ පළාත්වල ලන්දේසීන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය

(v) දහනවවන සියවස තුළ බ්‍රිතාන්‍යයන් යටතේ කෝපි වතු වගාව

(vi) ලංකා ජාතික සංගමය

(එක් සටහනකට ලකුණු 07 බැගින්)

* * *

www.artsapi.lk